# කෙටි කතාව

## සෝතාපන්න

ඉතින් පින්වතුනි, මේ සසර ගමන සුන්දර නැහැ. භයානකයි. මේ ගමන අවිනිශ්චිතයි. අපි මේ කරන කුසල් ප්‍රමාණවත් නෑ, මේ ගමන නිම කරන්න, අධිෂ්ඨානයෙන් ඊට එහා ගිය දෙයක් වටහා ගත්තොත් තමයි.

මොනවද මේ හාමුදුරුවෝ කියණ බණ. අපරාදේ  මම මේ වස් බණට ආරාධනා කළේ. සසර භයානක නිසානේ අපි මේ පින් කරන්නේ. අහ්;  බෞද්ධාගම වනසන්න වෙන ආගම් වලින් සල්ලි ගන්නවද කොහෙද?

තිලකාවතී උපාසිකා මාතාව සිය පුතුගේ නිවසට පැමිණියේ හදපිරි සතුටින්. ඇයගේ පුතු ඕස්ට්‍රේලියාවට සංක්‍රමණයවී නව නිවසක් ඉදිකර එහි පදිංචිවූ පසු විශ්‍රාමික ගුරුවරියක්වූ තම මව ගෙන්වා ගත්තේය. සමාගමක සුළු රැකියාවක් කරන ඔහු තම මවට හැකි උපරිමයෙන් සත්කාර කරමින් ඇය සතුටු කරයි. ආගම දහමට හිතැති පුතු සහ ලේලිය තම මෑණියන් පන්සල වෙත යොමු කළහ. මෑණියන්ට අවශ්‍ය ආකාරයට පින් දහම් කිරීමට නිදහස සලසා දුන්හ.

අද දින වස් බණ තිලකාවතී උපාසිකාව සහ තවත්  පිරිසකගේ අනුග්‍රහයෙනි. ඇය විහාරස්ථාන ශාලාවේ ඉදිරිපසම තබාගත් මිටි අසුනට බරදී සාවදානව බණ අසයි. ශාන්තවූ ඉරියව් දකින්නන්ගේ සිත නිවයි. වසා ගත් දෙනෙත දකින්නන්ට ඇයගේ ඒකාග්‍රතාව මොනවට පෙන්වයි.

ඔය ඇත්තෝ මේ සසරේ විඳින්න තියෙන හැම සැපයක්ම විඳලා තියෙන්නේ. ඇයි? තව දිව්‍ය සැප ප්‍රාර්ථනා කරලා දුක් කරපින්නා ගන්නේ? අපි හිතන්න ඕනෙ වෙනස් විදියට.

ඔය ආයෙත් කියවන්නේ වෙනස් වෙන්න. මෙතන මොකක් හරි හොරයක් තියෙනවා. අපරාදේ මේ කියවන බණ දිව්‍ය ලොකේ සැප නෑ. දුකයි කියන්නේ. ඒක දුක නම් පින් කලාම දිව්‍ය ලෝකේ යන්නේ. අනේ මගෙ දරුවන්ගේ තාත්තත් දෙවියෙක්. දේවාලේ කපු මහත්තයා එදා එයත් එක්ක කතා කළේ. මං මේ යන්තම් සැප විඳින්න ගත්ත විතරයි. මේ හාමුදුරුවන්ගේ බණ අහලා ජීවිතේට ගන්න දෙයක් නැහැ. ඔලුව විකාර කරනවා. අපේ ගමේ යාලුවෝ එක්ක සතියකට දවසක් සෝතාපන්න සිරිකෝසල උපාසක මහත්තයා ලගට ගිහින් අහන හරබර බණපදයක් මෙහේදී අහන්න නැහැනේ. ඇයි? දෙවියනේ පටිච්චසමුප්පාදය කියලා දෙන්න එපැයී? අභිධර්මයනේ නිවනට මග.

පින්වතුනි, මේ ධර්මය සර්පයෙක් වගේ වෙන්නත් පුලුවන්, වැරදියට භාවිතා කළොත්. අපි කුසල් විදියට අකුසල් මූල වඩන්න ගන්නවා. සමහර විට වැරදි අර්ථකතන යොදාගෙන ධර්මය වැරදියට භාවිතා කරනවා. උදාහරණයක් විදියට මේ පින්කම ගන්න. මේ අද දවසේ දායක පිරිස මේ පින්කම කරන්න හිතූ වෙලාවෙමයි කුසලය ඇති වුණේ. එකට කටයුතු කරද්දේ කුසලය වැඩුණා. දැන් අපි හිතමු කවරුහරි දායකයෙක් මේක ප්‍රසිද්ධිය පතා කළා කියල. එත් කුසලය තියෙනවා. අකුසල මූලයක් එක්ක.

මොන කෙහෙල්මලක්ද? ප්‍රසිද්ධියටත් එක්කනේ අපේ පුතා මේක කලේ. එයාගේ, අපේ නම් ලියලා බණ පටන්ගනිද්දිම හාමුදුරුවන්ට දුන්නේ පින් අනුමෝදන් කරන්න. එකනේ කරන විධිය. ප්‍රසිද්ධිය අකුසල වෙන්නේ කොහොමද? අද මං මේ උන්නාන්සේට කරන්නන් හොද වැඩක්. ධර්ම සාක්ච්ඡාවේදී අහනවා ලැජ්ජා හිතෙන්න ප්‍රශ්නයක්. අපේ සිරි කෝසල උපාසකතුමා දේශනා කලේ පටිච්ච සමුප්පාදය ගැන. ඒවත් අහනවා. අනික මම සෝතාපන්න සහතිකයත් ගත්තා. සෝවාන් වුණ නිසා මේ සිව් රූ දාගත්තට අපි තරම් උසස් පලයකට එන්න බැරි වෙලා ඇති.ඇයගේ සිත වේගයෙන් ගලා යයි. මැතකදී සෝවාන් වුණ බවට සිරිකෝසල උපාසකතුමාගෙන් සහතික ලැබූ ඇය ධර්ම දේශනාව පුරාම ස්වාමීන් වහන්සේගේ අඩුපාඩු පිළිබඳව විමසිලිමත් වූවාය. හොඳයි,දැන් ධර්ම දේශනාව අවසන් කරන්නට පෙර ප්‍රශ්න තිබෙනවානම් අහන්න කාලය, ධර්මදේශක අතිපූජ්‍යය බෙලිඅත්තේ ධර්මරක්ඛිත හිමි ශාලාවේ දායක පිරිසගේ දහම් ගැටලු සඳහා කාලය ලබාදුන් සේක.

අවසර සුවාමීන් වහන්ස, තිලකාවතී ගුරුමාතාව, උපාසිකාව දොහොත් මුදුන්දී වැඳ අවසර ගත්තාය. හාමුදුරුවනේ, සෝතාපන්න වුණු කෙනෙකුට තව ආත්ම හතකින් නිවන ලැබෙනවා. හාමුදුරුවෝ කිව්වා කුසල් කරලා දිව්‍ය ලෝකේ යන්න එපා, එක දුකක් කියලා. මං හිතන්නේ ඒ කතාව අසාධාරණයි.

ඇයි උපාසක අම්මා එහෙම කියන්නේ?ඇත්තටම ඔවුන් තව ආත්ම හතකින් නිවන් යනවා. ඒ ටිකවත් සැප විඳලා ඉන්න ඕනේ.

ඒ කිව්වේ, පැහැදලි මදී. ස්වාමීන් වහන්සේ ඉතා සන්සුන්ව ඇය විමසූහ.

මං සෝතාපන්නයි අපේ හාමුදුරුවනේ. ශාලාව කසුකුසුවෙන් පිරීගොස් ඇත. සියල්ලෝ පුදුමයත්, සතුටත් අතර දෝලණය වූහ. උපාසක අම්මේ, සෝතාපන්න වෙන්න තමයි, මේ බණ හරියට අහන්න ඕනේ. මං ඒක කිව්වේ මේ ධර්මය වැරදීයට අල්ලා ගත්තොත් සර්පයෙක් වගේ කියලා.

හාමුදුරුවනේ, මං කිව්වේ ඇත්තක්. තිලකාවතී උපාසිකාවට කේන්තිය ඉහවහා ගොස් ඇතත් තම උපාසිකා ප්‍රතිරූපය තාමත් ආරක්ෂා කරගත් ඇය සිනහවෙන්ම සිටියාය. වටපිට ශාලාවේ සියල්ලන් තමා දෙස බලමින් සිටින්නේ පුදුමයෙනි. ඇත්ත, පලමු වරට සෝවාන් අයෙක් තම දෑස් මායිමේ සිටීම ඔවුන්ට පුදුමයක්.

සෝතාපන්න කෙනෙක් බව මේ උපාසකඅම්මා දැනගත්තේ කොහොමද? ස්වාමීන් වහන්සේ ඉතාම කරුණාවෙන් ඇගෙන් අසා සිටියහ. ඇය තම බෑගය හැර කවරයක බහා තිබූ සෝතාපන්න සහතිකය ධර්මදේශකයන් වහන්සේට ඉදිරිපත් කළාය.



**අචිනි කොඩිප්පිලි**

---

# We Wish You a Merry Christmas

*Christmas Day falls on December 25 and is an occasion for Christians to celebrate the birth of Jesus. Many people, even if they are not Christian, give each other gifts, prepare special meals and decorate their homes at this time of year. Many aspects of the Christmas celebrations originated from winter celebrations in Europe. However they are increasingly influenced by the Australian climate and wildlife.*

On Christmas Day, children hope to receive gifts in a stocking or under the Christmas tree from the mythical figure Santa Claus. In the weeks before Christmas, they write letters to him so that he knows what they want. In some stories, Santa Claus wears a thick red, fur-trimmed suit and travels in a sleigh pulled by reindeer.

In others he wears shorts and a loose, brightly coloured shirt and his sleigh is pulled by six white kangaroos. In some families, individual members also exchange gifts

We wish you a Merry Christmas,
We wish you a Merry Christmas,
We wish you a Merry Christmas,
And a Happy New Year.

Good tidings to you,
And all of your kin,
Good tidings for Christmas,
And a Happy New Year.

We all know that Santa's coming,
We all know that Santa's coming,
We all know that Santa's coming,
And soon will be here.

Good tidings to you,
And all of your kin,
Good tidings for Christmas,
And a Happy New Year.

We wish you a Merry Christmas,
We wish you a Merry Christmas,
We wish you a Merry Christmas,
And a Happy New Year